

උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education



අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

| 13 ශ්‍රේණිය | 29 | S | I | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I<br>Communication & Media studies | කාලය : පැය දෙකයි<br>Time : Two hours |
|---|---|---|---|---|---|


01. රූපවාහිනියේ අතිශය ප්‍රචණ්ඩකාරී වැඩසටහනක් තනිව බලමින් සිටි සවිනිට නිවසින් එළියට යාමට බියක් ඇති විය. මෙම තත්ත්වය පිළිබඳව පර්යේෂණාත්මක ව අධ්‍යයනයක් සිදු කරන ලද්දේ ,
1. චිකාගෝ විශ්ව විද්‍යාලයයි.
2. පෙනිසිල්වේනියා විශ්ව විද්‍යාලයයි.
3. අයෝවා විශ්ව විද්‍යාලයයි.
4. ඉලිනොයිස් විශ්ව විද්‍යාලයයි.
5. සෝබෝන් විශ්ව විද්‍යාලයයි.

02. නවතම ව්‍යාපාරිකයෙක් තම නිෂ්පාදන ජනප්‍රිය කරවා සමාජය තුළ කිසියම් මතයක් ගොඩනැඟීමට ජනමාධ්‍ය යොදා ගත යුතු බව පැවසීය. සන්නිවේදනයේ ස්වභාවයට අනුව මෙම තත්ත්වය අයත් වන්නේ,
1. ක්‍රියා පාටිපාටියකට ය.
2. සන්දර්භානුගත වීමකට ය.
3. සංකේතාත්මක වීමකට ය.
4. බලයක් නිර්මාණය වීමකට ය.
5. විවිධත්වයක් නිර්මාණය කිරීමකට ය.

03. ජනමාධ්‍යයෙන් ගලා යන සන්දේශයක් නිසා නව යොවුන් වියේ දරුවන් තුළ ඍණාත්මක චිත්තවේග හා අසහනකාරී මානසිකත්වයක් ඇතිවන බව අවබෝධ කරගත් ගුරුවරු කණ්ඩායමක් අදාළ මාධ්‍ය ආයතනයට කතා කොට එම සන්දේශය විකාශය කිරීම නතර කරන්නැයි පැවසූහ. HUB ආකෘතියේ මූලිකාංග වලට අනුව මෙය,
1. දොරටු පාලනයකි.
2. මාධ්‍ය විස්තාරණයකි.
3. ප්‍රතිපෝෂණයකි.
4. නියාමනයකි.
5. බාධකයකි.

04. ආකල්ප හා වර්යාවල වෙනසක් ඇති කිරීමේ අපේක්ෂාවෙන් කථනය, ලේඛනය , රූපමය උපක්‍රම යොදාගනිමින්, අනුෂාංගික අංග කෙරෙහි වඩාත් අවධානය යොමු කරමින් සැලසුම් සහගත ව සංදේශයක් සැකසීම අයත් වන්නේ,
1. පෙළඹවීමේ කාර්යයට ය.
2. තොරතුරු සම්පාදන කාර්යට ය.
3. අධ්‍යාපන කාර්යට ය.
4. සමාජානුයෝජන කාර්යට ය.
5. විනෝදාස්වාද සම්පාදන කාර්යට ය.

05. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණ අතරට අයත් නොවන්නේ,
1. සක්‍රීය ප්‍රතිපෝෂණයක් තිබීමයි.
2. බාධක අවම වීමයි.
3. වාචික මෙන් ම අවාචික සන්නිවේදන ක්‍රම ද යොදාගත හැකි වීමයි.
4. සන්නිවේදක , ග්‍රාහක භූමිකා හුවමාරු වීමයි.
5. රහස්‍යභාවය හෙළි වීමයි.

06. ශ්‍රව්‍ය දෘශ්‍ය දර්ශන සහිත ව ඉතාමත් කාර්යක්ෂම ව සිදු කළ හැකි සන්නිවේදන වර්ගය වනුයේ,
1. ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයයි.
2. අන්තර් පුද්ගල සන්නිවේදනයයි.
3. අතථ්‍ය සන්නිවේදනයයි.
4. සමූහ සන්නිවේදනයයි.
5. මහජන සන්නිවේදනයයි.

07. ඉතා වේගයෙන් පැතිර යන මාරාන්තික වෛරස් රෝගයක් පිළිබඳව ජනමාධ්‍ය විසින් ප්‍රවෘත්ති විකාශයෙන් හෙළිදරව් කිරීමෙන් පමණක් නොනැවතී වෛද්‍ය විශේෂඥයින් කැඳවා ගනිමින් නැවත නැවත පැහැදිලි කිරීමේ කාර්යභාරය අයත් වන්නේ,

1. තොරතුරු සම්පාදන කාර්යයටය.
2. අර්ථකථනය කිරීමේ කාර්යට ය.
3. සුපරීක්ෂණ කාර්යට ය.
4. සාකච්ඡා මණ්ඩපයක කාර්යට ය.
5. උපදෙස් සම්පාදන කාර්යට ය.

08. වෛද්‍යවරියක් වීමට සිහින දකින රෂිනි තම ඉලක්කයට ළඟා වීමට අවශ්‍ය තොරතුරු රැසක් පොත් හා සඟරා කියවීමෙන් ලබා ගත්තා ය. ඇය තොරතුරු ලබාගත් මානය තෝරන්න.

1. සංජානන මානයයි.
2. චිත්තවේගීය මානයයි.
3. සදාචාරාත්මක මානයයි.
4. සෞන්දර්යාත්මක මානයයි.
5. අධ්‍යාපන මානයයි.

09. භාවාත්මක වර්යාවන් සෘජුවම ප්‍රකට කිරීමේ හැකියාව ඇති සන්නිවේදන වර්ගය වනුයේ,

1. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි.
2. අන්තර් පුද්ගල සන්නිවේදනයයි.
3. සමූහ සන්නිවේදනයයි.
4. මහජන සන්නිවේදනයයි.
5. අතථ්‍ය සන්නිවේදනයයි.

10. පහත ආකෘති අතරින් සම්ප්‍රේක්ෂණ සහ ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය පැහැදිලි කරන ලද සන්නිවේදන ආකෘතිය කුමක් ද?

1. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය
2. ශ්‍රාම් , ඔස්ගුඩ් ආකෘතියයි.
3. ෂැනොන් හා වීවර් ආකෘතියයි.
4. ඇරිස්ටෝටල් ආකෘතියයි.
5. HUB ආකෘතියයි.

11. සංස්කෘතීන් වල දක්නට හැකි ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A. බුද්ධිවාදී ලක්ෂණ දක්නට ලැබේ.
B. උසස් පරමාදර්ශයන් දක්නට ලැබීම.
C. ඉහළ ජනාකර්ෂණයක් දක්නට ලැබීම.
D. සෞන්දර්ය වටිනාකමක් දක්නට ලැබීම.
E. පාරම්පරිකව පැවතගෙන ඒම.

මේ අතරින් සම්භාව්‍ය සංස්කෘතියට පමණක් අයත් ලක්ෂණ වන්නේ,

1. A,B පමණි.
2. A,B හා C පමණි.
3. A,B හා E පමණි.
4. A,B හා D පමණි.
5. A,B,C,D,E යන සියල්ලම අයත් වේ

12. එක් අයෙකුගේ සිට තවත් අයෙක් දක්වා සිදු වන නව මාධ්‍ය ක්‍රමවේදයක් වන්නේ,

1. බ්ලොග් ( Blogs)
2. වි්ලොග් ( Vlogs)
3. වෙබ් ( Web)
4. යූ ටියුබ් ( You tube)
5. ඊ මේල් ( E mail

13. " උපකරණ , පාරිභෝගික ද්‍රව්‍ය, විවිධ සමාජීය සමූහයන්ගේ ව්‍යුහමය ලක්ෂණ , මානව සංකල්පනා, ශිල්ප, විශ්වාස හා චාරිත්‍රයන්ගෙන් අනුබද්ධ සමස්තය සංස්කෘතියයි" වශයෙන් සංස්කෘතිය පිළිබඳව නිර්වචනයක් ඉදිරිපත් කළේ,

1. එඩ්වඩ් ටයිලර් ය.
2. බී. මැලිනොව්ස්කි ය.
3. මාර්ෂල් මැක්ලූහන් ය.
4. මාර්කස් ටූලිස් සීසර් ය
5. මාර්කස් පර්සියස් කැටෝ ය.

14. සන්දේශයක් විශ්ලේෂණයේ දී සඵලදායී සන්දේශයක් සඳහා තිබිය යුතු ගුණාංග අතරට අයත් නොවන්නේ,

1. සරල බව යි.
2. විශේෂත්වයයි.
3. විදග්ධ බවයි.
4. ව්‍යුහයයි.
5. ඇලීමයි.


15. එකම වෙළෙඳ දැන්වීම නැවත නැවත ප්‍රචාරණය කරමින් සිදු කරන පෙළඹවීම සම්බන්ධයෙන් විචාරයක් සිදු කිරීමට වඩාත් යෝග්‍ය විචාර දෘෂ්ටිය වන්නේ,

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

1. ස්ත්‍රී වාදී විචාර දෘෂ්ටියයි.
2. මනෝවිශ්ලේෂණවාදී විචාර දෘෂ්ටියයි.
3. මාක්ස්වාදී විචාර දෘෂ්ටියයි.
4. දේශපාලනික විචාර දෘෂ්ටියයි.
5. සෞන්දර්යාත්මක විචාර දෘෂ්ටියයි.

- **අංක 16 සිට 18 දක්වා ප්‍රශ්න වලට පහත ආකෘතිය ඇසුරින් පිළිතුරු සපයන්න.**




16. ඉහත ආකෘතියට අනුව A, B, C අක්ෂර වලට වඩාත් ගැළපෙන පිළිතුර වන්නේ පිළිවෙළින්,
    1. සන්නිවේදක, බලපෑම, බාධක
    2. ආකේතකරණය, බලපෑම, විකේතකරණය
    3. විකේතකරණය, බාධක, ග්‍රාහකයා
    4. සම්ප්‍රේක්ෂණාගාරය, බලපෑම, විකේතකරණය
    5. සම්ප්‍රේක්ෂණාගාරය, බාධක, විකේතකරණය

17. මෙම ආකෘතිය ගණිතමය ආකෘතියක් වන්නේ කවර මූලිකාංගයක් නිසා ද?
    1. තොරතුරු මූලාශ්‍රය නිසාය.
    2. A නිසා ය.
    3. B නිසා ය.
    4. C නිසා ය.
    5. සන්දේශ අන්තය නිසා ය.

18. පහත සඳහන් ලක්ෂණ අතරින් මෙම ආකෘතියට පමණක් අදාළ ලක්ෂණ ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,
    A. සම්ප්‍රේක්ෂණ හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලියක් සහිතය.
    B. ගණිතමය ආකෘතියකි.
    C. අන්තර් ක්‍රියාකාරීත්වයකට මඟ පෙන්වයි.
    D. ග්‍රාහකයා සක්‍රීය කරවන ආකෘතියකි.
    E. සන්නිවේදනයේ තාක්ෂණික පැතිකඩ විවරණය කරයි.

    1. A,B හා E පමණි.
    2. A,B හා C පමණි.
    3. A,B හා D පමණි.
    4. B,C, D හා E පමණි.
    5. A,B,C,D හා E යන සියල්ලම.

19. ස්වකේන්ද්‍රය සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.
    1. ඔබව ඉදිරියට ගමන් කරවන ඉලක්ක ඇසුරින් සැකසේ.
    2. ඔබගේ දැනුම, ආකල්ප , කුසලතා , ලැදියාවන් ආදිය විහිදී ඇති පරාසයයි.
    3. සවිඥානික ව මෙන් ම අවිඥානිකව ද ගොඩ නැඟිය හැක.
    4. ස්ව කේන්ද්‍රය දුර්වල වන විට අවසන් ඉලක්ක ගැන දැනුමක් නැතිවේ.
    5. ඕනෑම මාධ්‍ය සන්දේශයකින් ස්වකේන්ද්‍රය ගොඩනැඟේ.

20. සාම්ප්‍රදායික මානවයාගේ බුද්ධි මට්ටම ( IQ) මනින මාධ්‍ය ක්‍රමවේදයක් වූයේ,
    1. ජනකවි ය.
    2. තේරවිලි ය.
    3. ප්‍රස්ථාව පිරුළු ය.
    4. උපමා උපමේයයන් ය.
    5. ජනකථා ය.

21. තමාගේ නොවන හැඟීමක් පවා තමාට වූ ලෙසින් තමන්ගේ කර ගැනීම ලියනාඩෝ ඩාවින්චිට අනුව
    1. දුර්ලභත්වයයි.
    2. සුවිදර්ශයයි.
    3. සධුගමනයයි.
    4. සංවේදනයයි.
    5. සම්බන්ධතා යි.

22. කිසියම් සිදුවීම් පෙළක ආරම්භය සිදු වන ස්ථානය, පසුබිම පිළිබඳ ව ප්‍රේක්ෂකයාට කිසියම් අවබෝධයක් ලබා දෙන රූපරාමුව වන්නේ,
    1. සංස්ථාපන රූපයකි.
    2. සමීප රූපයකි.
    3. අති සමීප රූපයකි.
    4. මධ්‍යම රූපයකි.
    5. උඩුකුරු දැක්ම රූපයකි.

23. ඔබ කිසියම් ආයතනයක මහජන සම්බන්ධතා නිළධාරී ලෙසින් පත්වීම් ලැබුවා යැයි සිතන්න. අදාළ ආයතනයට ගිය පසු මහජන ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා ඔබ අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රයක් නොවන්නේ,

1. ආයතනික කීර්තිය පිළිබඳවයි.
2. ආයතනයට හා සම්බන්ධ පාර්ශවවල පිවිසුම පිළිබඳවයි.
3. විවිධ මත සාදන්නෝ පිළිබඳවයි.
4. මාධ්‍ය ( ජනමාධ්‍ය හා නව මාධ්‍ය ) පිළිබඳවයි.
5. පර්යේෂණ හා දැනුම පිළිබඳවයි.

24. පහත දැක්වෙන්නේ මහජන සම්බන්ධතාව සඳහා යොදාගත හැකි සන්නිවේදන මෙවලම් කිහිපයකි.

A- ප්‍රවෘත්ති නිවේදන
B- වීඩියෝ ප්‍රවෘත්ති
C- පුවත් හසුන
D- වීඩියෝ සම්මන්ත්‍රණ
E- මාධ්‍ය කට්ටල
F- සමාජ මාධ්‍ය

ඉහත මෙවලම් අතරින් ද්වීමාර්ගික මෙවලම් අතරට අයත් වන මෙවලම් වන්නේ,

1. A,B,E,F ය.
2. A,B,C,D ය.
3. B,C,E,F ය.
4. B,D,E,F ය.
5. A,B,D,E,F ය.

25. සිද්ධි කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම අතරට අයත් නොවන ප්‍රකාශය වන්නේ,

1. ආයතනික හොඳ හිත හා ප්‍රතිරූපය ප්‍රවර්ධනයට
2. කාල කළමනාකරණයට හා මූල්‍ය කළමනාකරණයට
3. මාධ්‍ය ආචාර ධර්ම අනුගමනය කිරීමට
4. අර්බුධකාරී තත්ත්ව කළමනාකරණයට
5. ආයතනික පාර්ශවකරුවන් දින ගැනීමට හා රඳවා ගැනීමට

26. “සංවර්ධනය යනු මානව සංවර්ධනය මිස ද්‍රව්‍යමය සංවර්ධනයක් නොවේ” ලෙසින් සංවර්ධනය නිර්වචනය කළේ,

1. ඩඩ්ලි සියර්ස් ය.
2. එඩ්ගා ඕවන්ස් ය.
3. මහත්මා ගාන්ධි ය.
4. එඩ්වඩ් ටයිලර් ය.
5. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය

27. ලතින් අමෙරිකාව සහ කැරිබියන් සඳහා වන ආර්ථික කොමිසම විසින් ඉදිරිපත් කරන ලද පරායත්තතා න්‍යායෙන් අදහස් වන්නේ,

1. නූතනත්වයට , නවීකරණයට අසංවර්ධිත රටවල් පත්කිරීමයි.
2. ධනේෂ්වර සාරධර්ම ව්‍යාප්ත කිරීමයි.
3. කොමියුනිස්ට්වාදයේ ව්‍යාප්තිය අඩු කර ප්‍රජාතන්ත්‍රවාදය ව්‍යාප්ත කිරීමයි.
4. සංවර්ධනය නොවූ රටවලට නව අදහස් හා තාක්ෂණය ව්‍යාප්ත කිරීමයි.
5. දියුණු රටවල්වල ආර්ථිකයෙන් නොදියුණු රටවල් දියුණු කිරීමයි.

28. සංවර්ධන පණිවිඩ විසරණය සඳහා සමාජ මාධ්‍ය යොදා ගැනීමෙන් ඇති විය හැකි නිශේධනීය බලපෑමක් නොවන්නේ,

1. පෞද්ගලිකත්වය අනාවරණය වීම.
2. අනවශ්‍ය ප්‍රචණ්ඩත්වයකට යොමු වීම.
3. දත්ත විකෘතිකරණයට ලක්වීම.
4. අන්තර් ක්‍රියාකාරීත්වයකට යොමු වීමට හැකි වීම.
5. සයිබර් ප්‍රහාර වලට ලක් වීම.

29. රටක් සංවර්ධනය කරා මෙහෙය වීමේ දී සමාජීය සම්බන්ධතා හා සමානාත්මතාව ගොඩ නැඟීම අත්‍යාවශ්‍ය සාධකයකි. එහි නොතිබිය යුතු ලක්ෂණයක් වන්නේ,

1. මූලික සේවා වලට විශ්වීය ප්‍රවේශ සැපයීම.
2. විශේෂිත මානව අයිතිවාසිකම් නොමැති වීම.
3. සංවර්ධනය සඳහා සමාන අවස්ථා පැවතීම.
4. අවම අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
5. සාධාරණ හේතූන් මත වෙනස්කම් සිදු කිරීම.

30. කිසියම් පුද්ගලයෙක් ඔබගේ පෞද්ගලික තොරතුරු වලට අයථා ලෙස ඇතුළු වෙමින් අන්තර්ජාලය ඔස්සේ ඔබට අනවශ්‍ය බලපෑම් සිදු කරන්නේ නම් මේ පිළිබඳව ඔබ වහා දැනුවත් කළ යුතු ආයතනය වන්නේ,

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

1. පොලිසියට ය. 2. ග්‍රාම නිළධාරී කාර්යාලයට ය.
3. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයට ය. 4. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ය.
5. ප්‍රසිද්ධ රැහුම් පාලක මණ්ඩලයට ය.

31. මාධ්‍ය නියෝජිතයන්ගේ කැපී පෙනෙන මැදිහත් වීමක් සහිත ව නීතිය මඟින් ස්ථාපිත කරන ලද නියාමනය වන්නේ,
1. ස්වයං නියාමනය 2. සහ නියාමනය යි. 3. ව්‍යවස්ථාපිත නියාමනය
4. අභ්‍යන්තර නියාමනය 5. නෛතික නියාමනයයි.

32. පහත දැක්වෙන්නේ සන්නිවේදන හිමිකම තහවුරු කරන ප්‍රකාශ කිහිපයක් සහ ඒවායෙහි ක්‍රියාකාරීත්වයයි. ඒ අනුව ක්‍රියාකාරීත්වයට අදාළ ප්‍රකාශනය ඇතුළත් පිළිතුරු කාණ්ඩය වනුයේ,

| | | | |
|---|---|---|---|
| A | සාධාරණ භාවිතය | W | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය |
| B | රාජ්‍ය යාන්ත්‍රණයේ විනිවිද බවක් ඇති කරයි | X | මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය |
| C | තොරතුරු අයිතිය ද මූලික අයිතියක් ලෙස තහවුරු කරයි | Y | බුද්ධිමය දේපළ පනත |
| D | දෙවන ලෝක යුද්ධයේ අත්දැකීම් වල ප්‍රතිඵලයක් ලෙස බිහිවිය. | Z | තොරතුරු දැනගැනීමේ පනත |

1. AY, BZ, CW, DX 2. AY, BW, CZ, DX 3. AZ, BW, CX, DY
4. AY, BW,CX,DZ 5. AX, BW, CZ, DY

33. රාජ්‍ය නායකයින් , ප්‍රතිරූපයක් සහිත පුද්ගලයින් කෙටි පණිවිඩ යැවීම සඳහා වැඩි වශයෙන් යොදා ගන්නා සමාජ මාධ්‍ය යෙදවුම වන්නේ,
1. WhatsApp ය. 2. Imo ය. 3. X ( twitter ) ය.
4. Telegram ය. 5. Pinterest ය.

34. අර්බුදකාරී අවස්ථාවක මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා තොරතුරු හෙළිකිරීම මහජන සම්බන්ධතා ක්‍රමෝපායකි. මෙය ජනමාධ්‍ය කරුවාගේ දෘෂ්ටිකෝණයෙන් වඩාත් වැදගත් වන්නේ,

1. තොරතුරු විශාල ප්‍රමාණයක් ලැබෙන බැවිනි.
2. ලබාදෙන තොරතුරු පිළිබඳ ප්‍රශ්න කළ හැකි බැවිනි.
3. බලධාරීන් මුහුණට මුහුණ හමුවන බැවිනි.
4. කෙටි කාලසීමාවක් තුළ අවසන් කෙරෙන බැවිනි.
5. සියලු මාධ්‍ය වලට ගැළපෙන පරිදි තොරතුරු නිකුත් කරන බැවිනි.

35. ශ්‍රී ලාංකීය මාධ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා පිළිබඳව විමසීමේ දී මාධ්‍ය අන්තර්ගතයෙහි දක්නට හැකි කැපී පෙනෙන වෙනසක් නොවන්නේ,
1. සරල භාෂා භාවිතයයි.
2. වෙළෙඳ දැන්වීම් ප්‍රමාණාත්මක ව ඉහළ යාමයි.
3. ඉදිරිපත් කිරීමේ නව මාදිලි දක්නට ලැබීමයි.
4. විනෝදාස්වාදය කෙරෙහි වැඩි අවධානයක් දැක්වීමයි.
5. සංස්කාරක නිදහස අවම තත්ත්වයක් දක්නට ලැබීමයි.

36. පර්ගණක පද්ධති සම්පත් ඇසුරින් දත්ත ගබඩා කිරීම හා ඒවා නැවත ලබා ගැනීම කළ හැකි දත්ත ගබඩා හඳුන්වන නාමය වන්නේ,
1. දත්ත සංචිතකරණයයි. ( Database ) 2. වලාකුළු පරිගණකයි.( Cloud Computing)
3. ව්ලොග්ස් ය.( Vlogs ) 4. වෙබ් ය. (Web )
5. බ්ලොග්ස් ය. ( Blogs)

37. වෙළෙඳ දැන්වීම් කර්මාන්තය උපයෝගී කරගෙන මාධ්‍ය පද්ධතියේ ව්‍යුහ සහ ක්‍රියාකාරිත්වය ආර්ථිකමය බලපෑම අතින් ශක්තිමත් කරවීම හඳුන්වනුයේ,

1. පරිභෝජ්‍යකරණයයි. 2. ගෝලීයකරණයයි. 3. දැන්වීම්කරණයයි.
4. වාණිජකරණයයි. 5. කාර්මීකරණයයි.

38. මිනැර්වා නාට්‍ය කණ්ඩායමෙහි ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකාවේ තිරගත වූ මුල්ම සිනමා පටය වන්නේ,

1. රේඛාවයි. 2. කඩවුණු පොරොන්දුවයි. 3. වූටි බබා යි.
4. වැලි කතර 5. බඹරු ඇවිත්

39. මහජන සම්බන්ධතා නිළධාරියෙකුට මාධ්‍ය සමඟ මහජන සම්බන්ධතාව පැවැත්වීමට පහත අවස්ථා වලට වඩාත් යෝග්‍ය වන මාධ්‍ය ක්‍රමවේදය තෝරන්න.

- නව රජය මඟින් සිදු කරන Clean Sri Lanka වැඩසටහන පිළිබඳව මහජනතාවට විස්තරාත්මකව පැහැදිලි කිරීම.
- බිස්කට් නිෂ්පාදන සමාගමක් සිදු කළ නව නිෂ්පාදනයක් ජනතාවට හඳුන්වා දීම.
- හෙට දින කොළඹ ඇතුළු තදාසන්න ප්‍රදේශ වලට පැය පහක් ජල කප්පාදුවක් සිදු වන බව ජනතාවට දැන්වීම.

1. මාධ්‍ය නිවේදන, වීඩියෝ ප්‍රවෘත්ති, මාධ්‍ය සාකච්ඡා
2. මාධ්‍ය සාකච්ඡා, වීඩියෝ ප්‍රවෘත්ති, මාධ්‍ය නිවේදන
3. මාධ්‍ය සාකච්ඡා, ප්‍රවර්ධන වැඩසටහන්, මාධ්‍ය නිවේදන
4. පුවත් නිල නිවේදන, ඡායාරූප නිවේදන, මාධ්‍ය කෙටි ඉදිරිපත් කිරීම්.
5. ප්‍රවර්ධන වැඩසටහන්, පූර්ව ප්‍රචාරක දැන්වීම්, මාධ්‍ය නිවේදන

40. ගැටුමක් ඇති වූ පසු එය නිරාකරණය කිරීම සඳහා සාකච්ඡා කිරීම වඩාත් වැදගත් වෙයි. ඒ සඳහා යොදා ගත හැකි පියවරක් නොවන්නේ,

1. ගැටුම් තේරුම් ගැනීම.
2. ප්‍රතිපක්ෂය සමඟ සන්නිවේදනය කිරීම .
3. සාකච්ඡාව සිදුකර ගැනීම ගැටුමට සම්බන්ධ පාර්ශව දෙක පමණක් තනිව සිදු කර ගැනීම.
4. කළ හැකි යෝජනා ඉදිරිපත් කිරීම.
5. විකල්ප විසඳුම් සොයා ගැනීම.

41. ගුවන් විදුලි මාධ්‍ය සතුවිය යුතු සුවිශේෂී ලක්ෂණය ලෙස සැලකිය හැක්කේ,

1. මිනිස් සිත කම්පනය කරන මාධ්‍යයක් වීමයි. 2. සරල භාෂා රටාවකින් යුතු මාධ්‍යයක් වීමයි.
3. ගෘහස්ථව පරිහරණය කරන මාධ්‍යයක් වීමයි. 4. හුදෙකලා බව නැති කරන මාධ්‍යයක් වීමයි.
5. වෙළඳ ප්‍රචාරණ මාධ්‍යයක් වීමයි.

42. සමාජ මාධ්‍ය කාර්යභාරය අතරට අයත් නොවන්නේ,

1. විවිධ තොරතුරු බෙදා හදා ගත හැකි වීම.
2. සමාජ මත වෙනස් කළ හැකි වීම.
3. පුද්ගලයන් සංවිධානය කළ හැකි වීම.
4. නිරන්තරයෙන් වාරණයට හා දොරටුපාලක ක්‍රියාවලියට හසු කර ගත හැකි වීම.
5. පුද්ගලයන් වැඩි පිරිසකට ඇමතිය හැකි වීම.

43. මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ ගුවන්විදුලි සාකච්ඡාවක් තුළ දී ඉදිරිපත්වූ මත වාද කිහිපයක් පහත දැක්වේ.

A- දේශීය සංස්කෘතියට වඩා බටහිර සංස්කෘතිය මූලාශ්‍ර කරගත් බව
B- මාධ්‍ය තාක්ෂණය සමඟ ප්‍රතිබද්ධ වී ඇති බව
C- සමාජ ගතික වලට අනුව හැඩගැසීම
D- ස්වභාවික ක්‍රියාවලියට වඩා සැලසුම් කරන ලද ක්‍රියාවලියක් වීම

ඉහත සඳහන් අදහස් වලින් **නිරවද්‍ය** වන්නේ,

1. A හා B පමණි. 2. B හා C පමණි. 3. A, B හා D පමණි.
4. B, C හා D පමණි. 5. A, B, C, D යන සියල්ලම නිරවද්‍ය වේ.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

44. නිර්මාණාත්මක සන්නිවේදනයේ වැදගත්කම අතරට අයත් නොවන්නේ ,
1. අවිඥානිකව යමක් චින්දනයට අවස්ථාව ලැබීම.
2. ආධ්‍යාත්මික ප්‍රබෝධය හා චිකිත්සාව ඇති කර ගැනීමට හැකි වීම.
3. ගැඹුරු සංකල්ප හා දර්ශනවාද පහසුවෙන් අවබෝධ කරගැනීමට හැකි වීම.
4. සතුට හා සැහැල්ලුවක් ඇති කර ගැනීමට .
5. සංකීර්ණ හා අවිවේකී චත්මන් මානව ස්වභාවය ජය ගැනීමට අවස්ථාව ලැබීම.

45. සමීක්ෂණ ක්‍රියාවලියකදී අනුගමනය කළ යුතු පියවර කිහිපයක් පහත් දැක්වේ. එම පියවර අනුපිළිවෙළට නිවැරදිව සඳහන් වූ පිළිතුර වන්නේ,

A- අරමුණු හඳුනා ගැනීම B -ගැටලුව හඳුනාගැනීම C - මාතෘකාව තීරණය කිරීම
D -දත්ත විශ්ලේෂණය කිරීම E- දත්ත රැස් කිරීම F- නිගමනය
G - වාර්තාව ලිවීම

1. A,B,C,D,E,F,G 2. A,C,E,B,D,F,G 3. B,A,C,E,D,F,G
4. B,C,A,D,E,F,G 5. B,A,C,D,E,F,G

46. සමිත තම මාධ්‍ය ආයතනයෙහි වැඩසටහන් කෙතෙක් දුරට ජනාකර්ෂණය වී ඇත්දැයි සමීක්ෂණයක් පැවැත්වීමට අදහස් කළේය. ඒ සඳහා ඔහු දත්ත රැස් කිරීමේ දී පූර්ව වාර්තාවල ඇතුළත් සංඛ්‍යා දත්ත යොදා ගනී නම් ඒවා,
1. ප්‍රමාණාත්මක දත්ත වේ. 2. ප්‍රමාණාත්මක ප්‍රාථමික දත්ත වේ.
3. ප්‍රමාණාත්මක ද්විතීක දත්ත වේ. 4. ගුණාත්මක දත්ත වේ.
5. ගුණාත්මක ද්විතීක දත්ත වේ.

47. ශ්‍රී ලංකා රාජ්‍ය සහ ජනතාව අතර ඉහළ සම්බන්ධයක් ගොඩනැඟීමේ පරමාර්ථයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට නිර්දේශ කරන ලද්දේ,
1. වෛද්‍යනාදන් කොමිෂම යි. 2. සෝල්බරි කොමිසම යි. 3. වීරසූරිය කොමිසම යි.
4. තොරතුරු කොමිසම යි. 5. හුළුගල්ල කොමිසම යි.

48. ගෝලීයකරණයෙහි නව ප්‍රවනතා වලට අනුව ප්‍රධාන දෘෂ්ටිවාදය ලෙස සැලකෙන්නේ තනි ලෝක සංස්කෘතියක් ( Single World Culture) බිහි කිරීමයි. මෙහි දී ඇති විය හැකි නිශේධනීය බලපෑමක් විය හැක්කේ,
1. සංස්කෘතික සමානතා හා අසමානතා ඉදිරියට පැමිණීම.
2. තාක්ෂණික දියුණුවේ ව්‍යාප්තියක් සිදු වීම.
3. කුල භේද වැනි ඇතැම් දුගී සංස්කෘතික ලක්ෂණ යටපත් කර ගත හැකි වීම.
4. අන්තර් ක්‍රියාකාරීත්වය හා ප්‍රබල සම්බන්ධතා ගොඩ නැඟීම.
5. කුඩා රාජ්‍ය හා පෙරදිග සංස්කෘතික ලක්ෂණ ලොව පුරා ව්‍යාප්තියට අවකාශ ලැබීම.

49. සති අන්ත විවේකයේ දී සිය දෙමාපියන් සහ දරුවන් දෙදෙනා ද සමඟ සිනමා පටයක් බැලීමට යාමට සමරසිංහ යුවළ කතිකා කර ගත්හ. ඔවුන්ට නැරඹීමට වඩාත් සුදුසු චිත්‍රපට වර්ගීකරණයක් ලෙස ඔබ යෝජනා කරන්නේ,
1. U ගණයේ චිත්‍රපටයකි. 2. A ගණයේ චිත්‍රපටයකි. 3. X ගණයේ චිත්‍රපටයකි.
4. U හා A යන වර්ග දෙකෙන් ම ගැටලුවක් නැත. 5. කවර ගණයේ වුවද ගැටලුවක් නැත.

50. පහත සඳහන් ප්‍රකාශන වල X හි අගය වැඩි වන විට Y හි වැඩිවීම කෙරෙහි බලපෑමට ලක් නොවන වරණය වන්නේ,

| | X | Y |
|---|---|---|
| A | ස්වයං නිර්ණය | ස්වාධීනත්වය |
| B | යැපුම් මානසිකත්වය | දරිද්‍රතාව |
| C | සන්නිවේදක කේන්ද්‍රීය වීම | සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය |
| D | විශේෂිත මානව අයිතිවාසිකම් | සමාජ බෙදීම් හා අසමානතා |

1. A ය. 2. Bය. 3. C ය. 4. D ය. 5. C හා D ය.

Past Papers Wiki

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

| 13 ශ්‍රේණිය | 29 | S | II | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II<br>Communication & Media studies | කාලය : පැය තුනයි<br>Time : Three hours |
|---|---|---|---|---|---|

උපදෙස් : ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 40කි.
අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

1. ඵලදායී සන්නිවේදනය යහපත් මානව අන්තර් සබඳතා පවත්වා ගැනීමට ඉවහල් වේ.
   (i) ඵලදායී සන්නිවේදනය සඳහා සන්නිවේදකයෙකු අවධානය යොමු කළ යුතු කරුණු **හතරක්** නම් කරන්න. (ලකුණු 04)
   (ii) මානව අන්තර් සබඳතා පවත්වාගැනීම සඳහා නව මාධ්‍ය යොදා ගැනීමේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
   (iii) අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන තුනක් විස්තර කරන්න. (ලකුණු 12)
   (iv) ආයතනයක පැවැත්ම සඳහා අවශ්‍යවන විධිමත් සන්නිවේදනයේ ලක්ෂණ **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 16)

2. මතවාද ගොඩ නැංවීමේදී ජනමාධ්‍යය හා සමාජ මාධ්‍යය ප්‍රමුඛ වේ.
   (i) මාධ්‍ය ග්‍රාහකයෙක් මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය කර ගැනීමේ ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)
   (ii) මාධ්‍ය මගින් මාධ්‍ය ආචාර ධර්ම අනුගමනය කිරීමේ වැදගත්කම පිළිබඳ කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
   (iii)පහත සඳහන් දෘෂ්ටිවාද මාධ්‍ය සන්දේශ විශ්ලේෂණය සඳහා අදාල කර ගත හැකි ආකාරය උදාහරණය බැගින් සඳහන් කරමින් පැහැදිලි කරන්න.
      (අ) මාක්ස්වාදය
      (ආ) මනෝවිශ්ලේෂණය (ලකුණු 12)
   (iv) මාධ්‍ය දැන්වීම්කරණයේ සමාජ බලපෑම පහත කරුණු ඇසුරින් පැහැදිලි කරන්න.
      (අ) පරිභෝජනය
      (ආ) ආකල්ප (ලකුණු 16)

3. ජන සන්නිවේදන ක්‍රියාවලියේ සංකීර්ණත්වය ශාස්ත්‍රීය අධ්‍යයනයන් මගින් විග්‍රහ කර ඇත.ය

   (i) HUB ආකෘතියේ විශේෂතා **දෙකක්** දක්වන්න. (ලකුණු 04)
   (ii) මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව පිළිබඳ කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
   (iii)ජන සන්නිවේදන ක්‍රියාවලිය තුළ දොරටුපාලකයින්ගේ මැදිහත්වීම දක්නට ලැබේ. දොරටුපාල ක්‍රියාවලියේ **වාසි** සහ **අවාසි එක** බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 12)
   (iv) ජන මාධ්‍ය ග්‍රාහක ක්ෂේත්‍රයේ ප්‍රතිපෝෂණය ලබා ගැනීම සඳහා සමීක්ෂණ යොදා ගැනීමේ වාසි **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 16)

4. මානව නිර්මාණශීලීත්වය සුවිශේෂ වේ.

(i) ජේම්ස් වොට්සන් විසින් ඉදිරිපත් කරන ලද නිර්මාණශීලීත්වය මගින් ඉටුකරගත හැකි කාර්යයන් **හතරක්** දක්වන්න . (ලකුණු 04)

(ii) මාධ්‍ය මගින් ජනයා පෙළඹවීම සඳහා යොදා ගන්නා නිර්මාණාත්මක උපක්‍රම **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) නිර්මාණාත්මක මූලාශ්‍ර ගවේෂණය කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගැනීමේ වාසි **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) නිර්මාණාත්මක කාර්ය සඳහා ජනශ්‍රැතිය යොදා ගැනීමේ ප්‍රයෝජන **හතරක්** විස්තර කරන්න. (ලකුණු 16)

5.

(i) ශ්‍රී ලංකාව තුළ නිර්මාණයක අයිතිය ආරක්ෂා කරනු ලබන නීතිය කුමක්ද? (ලකුණු 04)

(ii) වර්තමාන මාධ්‍ය අන්තර්ගතයෙහි දක්නට ලැබෙන ප්‍රවණතා **හතරක්** නම් කර ඉන් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii)ගෝලීයකරණයේ සමාජ ප්‍රවණතා **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) මාධ්‍ය මගින් ව්‍යාප්ත කරනු ලබන ජනප්‍රිය සංස්කෘතියේ විශේෂතා **හතරක්** විස්තර කරන්න. (ලකුණු 16)

6. පාසලේ විවිධ ප්‍රසංගය සංවිධානය කිරීමේදී සාමූහිකව කටයුතු කළ යුතු බව විදුහල්පතිතුමා අවධාරණය කළේය.

(i) සමූහ සන්නිවේදනයේ ප්‍රයෝජන **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) පාසලේ මහජන සම්බන්ධතා පැවැත්වීමේ අවශ්‍යතාව පිළිබඳ කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) විවිධ ප්‍රසංගය පටිගත කර රූපවාහිනී නාලිකාවක් මගින් විකාශය කිරීමට කටයුතු සැලසුම් කර තිබේ. රූපවාහිනී මාධ්‍යයේ විශේෂතා **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) විවිධ ප්‍රසංගය අතර තුර දී හදිසියේ මතුවිය හැකි ගැටලු **දෙකක්** නම් කර ඒ සඳහා පෙර සූදානමක් ඇති කර ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 16)

7. (i) සංවර්ධනය සඳහා සන්නිවේදන ක්‍රියාකාරකම් වල නිරත වන විට දී සංවර්ධනයේ ප්‍රතිලාභ ලබන ප්‍රජා කණ්ඩායම් සමග ද්වී මාර්ගික සම්බන්ධතා ඇති කර ගැනීමේ වැදගත්කම පිළිබඳ කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ආයතනික මහජන සම්බන්ධතාව සඳහා ද්වී මාර්ගික සමමිතික ආකෘතියට අදාලව යොදා ගත හැකි මහජන සම්බන්ධතා මෙවලම් සහ විධි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)

(iii) මාධ්‍ය නියාමනය කිරීම සඳහා යොදා ගන්නා මූලික ප්‍රවේශ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා **හතරක්** විස්තර කරන්න. (ලකුණු 16)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අ.පො.ස. උසස් පෙළ විභාගය 2025

29) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පිළිතුරු පත්‍රය


| ප්‍රශ්න අංකය | නිවැරදි පිළිතුර | ප්‍රශ්න අංකය | නිවැරදි පිළිතුර |
|---|---|---|---|
| 01 | 2 | 26 | 2 |
| 02 | 4 | 27 | 5 |
| 03 | 4 | 28 | 4 |
| 04 | 1 | 29 | 1 |
| 05 | 5 | 30 | 3 |
| 06 | 3 | 31 | 2 |
| 07 | 2 | 32 | 1 |
| 08 | 1 | 33 | 3 |
| 09 | 2 | 34 | 2 |
| 10 | 3 | 35 | 5 |
| 11 | 4 | 36 | 2 |
| 12 | 5 | 37 | 4 |
| 13 | 2 | 38 | 2 |
| 14 | 3 | 39 | 3 |
| 15 | 2 | 40 | 3 |
| 16 | 5 | 41 | 2 |
| 17 | 3 | 42 | 4 |
| 18 | 1 | 43 | 5 |
| 19 | 5 | 44 | 1 |
| 20 | 2 | 45 | 3 |
| 21 | 4 | 46 | 3 |
| 22 | 1 | 47 | 2 |
| 23 | 5 | 48 | 5 |
| 24 | 4 | 49 | 1 |
| 25 | 3 | 50 | 3 |

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

# 25% OFF
# ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



**ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්**

## ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

**Cash On Delivery Available**

# ORDER GCE A/L SHORT NOTES, MODEL, REVISION BOOKS & PAST PAPERS IN SINHALA, ENGLISH & TAMIL MEDIUM





# LOL BOOK STORE

**CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE**

**WHATSAPP - 0717774440**

**WEBSITE: WWW.LOL.LK**

## GET READY FOR YOUR A/Ls WITH LOL BOOK STORE!